# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1823/68 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 සැප්තැම්බර් මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ 05,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1963 පෙබරවාරි මස 27 වැනි දින අංක 13535 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කළ වෙනස් කරනු ලද්දාවූ ද අවසන් වරට 2010 ජූලි 30 දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූද තීරණ එම උපලේඛනයේ 11 වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*11 වන කොටස*

*1 වැනි තීරය*

***කම්කරුවන්ගේ පන්තිය***

*1 වැනි ශ්‍රේණිය :*

ප්‍රධාන අයිස්ක්‍රීම්/පළතුරු යුෂ/ජෑම් සාදන්නෝ, (ස්වාභාවික හා කෘත්‍රීම රසකාරක යොදා) කංකානම්වරු, ප්‍රධාන සිරප් සාදන්නෝ, ජල පවිත්‍ර යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කෑන් සාදන්නෝ, වඩුවෝ (ස්වයංකාරී) පුරවන්නෝ, හරිවැරදි බලන්නෝ.

*11 වැනි ශ්‍රේණිය :*

සහකාර අයිස්ක්‍රීම්/පළතුරු යුෂ/ජෑම් සාදන්නෝ, (ස්වාභාවික හා කෘත්‍රීම රසකාරක යොදා) මෙම කර්මාන්තයට අදාළ ද්‍රව්‍ය නිපදවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ, කෑන් අළුත්වැඩියා කරන්නෝ, කාබන්ඩයොක්සයිඩ් වායු පාලනය කරන්නෝ, සහකාර සිරප් සාදන්නෝ, සිරප්වරු, ක්‍රවුනර්වරු, ශුද්ධ බෝතල පිරික්සන්නෝ, කාබනේටර් ඔපරේටවරු, නිෂ්පාදිතයන් ගණන් කරන්නෝ, (අතින්) පුරවන්නෝ, (ස්වයංකාරී) ලේබල් කරන්නෝ, සෝදනයන්ගෙන් බෝතල් ඉවත් කරන්නෝ, ස්වයංකාරී යන්ත්‍ර වලින් සිසිල් බීම නිපදවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ, අයිස් තෙලන්නෝ.

*111 වැනි ශ්‍රේණිය :*

අයිස්ක්‍රීම්/පළතුරු යුෂ/ජෑම් බඳුන් පුරවන්නෝ, අයිස්ක්‍රීම්/පළතුරු යුෂ/ජෑම් අසුරන්නෝ, අයිස් අසුරන්නෝ, අයිස් පැක්කරන්නෝ, අයිස් පටවන්නෝ, සිරප් කාමර කම්කරුවෝ, බෝතල් මිටි කඩන්නෝ, බෝතල් තෝරන්නෝ නොහොත් ශුද්ධ කරන්නෝ, සෝදනයට බෝතල් දමන්නෝ, පෙට්ටි පුරවන්නෝ, බෝතල් පැක් කරවන්නෝ, ශුද්ධ කරන්නෝ නොහොත් අතුගාන්නෝ, බෝතල් අතින් ශුද්ධ කරන්නෝ, පෙට්ටි ගෙන යන්නෝ නොහොත් අට්ටි ගසන්නෝ, ගබඩා කම්කරුවෝ, (අතින්) ලේබල් කරන්නෝ, රථවලට බඩු පටවන්නෝ.

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *සේවා වර්ෂය* | *1 වැනි ශ්‍රේණිය රු. ශත* | *11 වැනි ශ්‍රේණිය රු. ශත* | *111 වැනි ශ්‍රේණිය රු. ශත* |
|---|---|---|---|
| 1 වර්ෂය | 10,125.00 | 9,720.00 | 9,315.00 |
| 2 වර්ෂය | 10,275.00 | 9,845.00 | 9,415.00 |
| 3 වර්ෂය | 10,425.00 | 9,970.00 | 9,515.00 |
| 4 වර්ෂය | 10,575.00 | 10,095.00 | 9,615.00 |
| 5 වර්ෂය | 10,725.00 | 10,220.00 | 9,715.00 |
| 6 වර්ෂය | 10,875.00 | 10,345.00 | 9,815.00 |
| 7 වර්ෂය | 11,025.00 | 10,470.00 | 9,915.00 |
| 8 වර්ෂය | 11,175.00 | 10,595.00 | 10,015.00 |
| 9 වර්ෂය | 11,325.00 | 10,720.00 | 10,115.00 |
| 10 වර්ෂය | 11,475.00 | 10,845.00 | 10,215.00 |
| 11 වර්ෂය | 11,625.00 | 10,970.00 | 10,315.00 |
| 12 වර්ෂය | 11,775.00 | 11,095.00 | 10,415.00 |
| 13 වර්ෂය | 11,925.00 | 11,220.00 | 10,515.00 |
| 14 වර්ෂය | 12,075.00 | 11,345.00 | 10,615.00 |
| 15 වර්ෂය | 12,225.00 | 11,470.00 | 10,715.00 |
| 16 වර්ෂය | 12,375.00 | 11,595.00 | 10,815.00 |
| 17 වර්ෂය | 12,525.00 | 11,720.00 | 10,915.00 |
| 18 වර්ෂය | 12,675.00 | 11,845.00 | 11,015.00 |
| 19 වර්ෂය | 12,825.00 | 11,970.00 | 11,115.00 |
| 20 වර්ෂය | 12,975.00 | 12,095.00 | 11,215.00 |
| 21 වර්ෂය | 13,125.00 | 12,220.00 | 11,315.00 |
| 22 වර්ෂය | 13,275.00 | 12,345.00 | 11,415.00 |
| 23 වර්ෂය | 13,425.00 | 12,470.00 | 11,515.00 |
| 24 වර්ෂය | 13,575.00 | 12,595.00 | 11,615.00 |
| 25 වර්ෂය | 13,725.00 | 12,720.00 | 11,715.00 |

08 - 1062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.